# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,115- 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 672 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 672 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

671 - B 81505— 5,403 (2019/03)
F 1 -

# පළාත් සභා නිවේදන

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

### විනෝද බදු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් පාලන අමාත්‍යවරයා මා, 267 වන අධිකාරිය වූ විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය හා කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන් එහි ලේකම්ගේ පහත සඳහන් 2016.04.28 දිනැති අංක 05.01.38 දරන තීරණය අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පලකරනු ලැබේ.

දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාප්‍රවාහන සහ
සංචාරක කටයුතු අමාත්‍ය (වයඹ පළාත).

2017 ක් වූ අගෝස්තු මස 30 වැනි දින,
කුරුණෑගල දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටු කරන පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. එම්. නිමල් ජයසිංහ වන මම, (267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහයක සමාන බද්දක් පනවා අයකළ යුතු යැයි ද, මෙම තීරණය *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමු වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද 2016.04.28 දිනැති අංක 05.01.38 දරන තීරණය යටතේ මා තීරණය කරමි.

03-1155

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019

2019 මාර්තු මස 08 වැනි දින අංක 2,114 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. *යෝග්‍යතා :*

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 2019.04.08 දින හෝ එදිනට පෙර ලැබෙන සේ අයදුම්පත් යොමු කල යුතුය යන වගන්තිය "**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 2019.04.18 දින හෝ එදිනට පෙර ලැබෙන සේ අයදුම්පත් යොමු කල යුතුය**" ලෙස සංශෝධනය කරමි.

1.1 *සුදුසුකම් :*

II ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂි කරන ලද පහත VII පරිදි සඳහන් විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම යන වගන්තිය "**ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂි කරන ලද පහත VI පරිදි සඳහන් විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම**"ලෙස සංශෝධනය කරමි.

2:1 පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු වෙනුවෙන් 2019.04.08 දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ට අයදුම් කළ හැකිය යන්න "**පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු වෙනුවෙන් 2019.04.18 දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ට අයදුම් කළ හැකිය**"

2:2 2011.01.01 දින සිට ක්‍රියාත්මක නව බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ යන වගන්තිය "**2008.07.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ**" ලෙස සංශෝධන කරමි.

2:3 තරග විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. (විභාග ප්‍රතිඵල මත බඳවා ගැනීමේ කාලසීමාව 2020.12.31 දිනට නියමිත පුරප්පාඩු සඳහා පමණක් අදාළ වේ.) යන වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.

**තරග විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. (විභාග ප්‍රතිඵල මත බඳවා ගැනීමේ කාලසීමාව 2020.12.31 දිනට නියමිත පුරප්පාඩු සඳහා පමණක් අදාළ වේ.)**

**ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය**

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය - (කාල පැය 01 යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම - (කාලය පැය 01 යි) | 100 | 40 |

**විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය**

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

**විෂය අංක 02 - සාමාන්‍ය දැනීම**

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනීම හා/හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳව සාමාන්‍ය දැනීම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. (විභාග ප්‍රතිඵල මත බඳවා ගැනීමේ කාලසීමාව 2020.12.31 දිනට නියමිත පුරප්පාඩු සඳහා පමණක් අදාළ වේ.)

1. ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය.

   *ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :*

   ප්‍රායෝගික පරීක්ෂණ සඳහා විනාඩි 5කට නොඅඩු

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | |

02. *ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :*

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

03. *නිර්ණායකයන්හි අරමුණ :*

i. අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

ii. පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

iii. සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාල කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

iv. කාල කළමනාකරණය.
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.

03. *අයදුම් කිරීමේ ක්‍රමය :*

3:3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.04.08 දින හෝ එදිනට පෙර "**ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 109, මහා වීදිය, බත්තරමුල්ල**" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවරේ "බස්නාහිර පළාත් සහා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019" යන්න සහ ඉල්ලුම් කරන විෂය/ගුරු වර්ගය සඳහන් කළ යුතුය යන්න "**නිවැරදිව සම්පූර්ණ කරනලද අයදුම්පත්‍රය 2019.04.18 දින හෝ එදිනට පෙර "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 109, මහා වීදිය, බත්තරමුල්ල**" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවරේ "**බස්නාහිර පළාත් සහා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019**" යන්න සහ ඉල්ලුම් කරන විෂය/ගුරු වර්ගය සඳහන් කළ යුතුය" ලෙස සංශෝධනය කරමි.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

03-1528

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.